අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2025(2026)

"ප්‍රායෝගික පරීක්ෂණ අත්වැල"

පෙරදිග සංගීතය

ගිරිඋල්ල අධ්‍යාපන කලාපය



සැකසුම - කපිල පතිරත්න (ගුරු උපදේශක)

කලාප අධ්‍යාපන කාර්යාලය - ගිරිඋල්ල

චින්තා ප්‍රියංගනී (සංගීතාචාරිනී)

ගිරි/ඊරියගොල්ල ම.ම.වි.

අධීක්ෂණය

ජී.ඒ.රණාවක

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(සෞන්දර්ය)

කලාප අධ්‍යාපන කාර්යාලය - ගිරිඋල්ල

ප්‍රායෝගික පරීක්ෂණයට අදාළ ගායන/වාදන වල Audio සහ Video පාඩම් මාලා සහිතව මෙම පොත වෙනුවෙන්ම සකස් කළ, වෙබ් අඩවියට පිවිසීම සඳහා මෙම QR කේතය හෝ Link එක භාවිත කරන්න.

https://sites.google.com/view/grade-11-music/home

පෙර වදන

2025(2026) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටින ගිරිඋල්ල කලාපයේ දූ දරුවන් වෙනුවෙන් මෙම "ප්‍රායෝගික පරීක්ෂණ අත්වැල" නම් පොත සකස් කිරීමට අදහස් කළෙමි. ලිඛිත විභාගයෙන් සැලකියයුතු කාලයකට පසුව ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන බැවින්, එම කාලසීමාව තුළ පුහුණුවීම් කටයුතු සිදුකිරීමට සහායක් වීම මෙහි අරමුණයි.

ඔබවෙත ලබාදෙන මෙම පොතෙහි විශේෂත්වයක් ඇත. එනම් ප්‍රායෝගික පරීක්ෂණයට අදාළ ගායන, වාදන සහ නිර්දේශිත ගීත ඇතුළත් අන්තර්ජාල වෙබ් අඩවියක සබැඳියක් ද ලබා දීමයි. එම වෙබ් අඩවිය මේ පොත සඳහාම නිර්මාණය කළ අතර, එමගින් ප්‍රායෝගික කොටස් ශ්‍රවණය කරමින් සහ නරඹමින් පුහුණුවීම් සිදුකිරීමට අවකාශය සැලසෙනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සහ සංගීත විෂයය හා බැඳුණු තාක්ෂණය පිළිබඳව වසර ගණනාවක් පුරා සිදුකළ විවිධ ක්‍රියාකාරකම් තුලින් මා ලබාගත් අත්දැකීම් සහ දැණුම මේ සඳහා භාවිතා කළ අතර, එය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත්වන සිසුන්ගේ ප්‍රමාණයෙහි යම් වැඩිවීමක් ඇතිකිරීම සඳහා මා විසින් සිදුකරණ ලද පර්යේෂණාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයකි.

2019 වර්ෂයේ ඇතිවූ කෝවිඩ් -19 වසංගත තත්ත්වය තුළ පාසල් අධ්‍යාපනය පසුබැමකට ලක්විය.

එවකට අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ආචාර්ය නිශාද් හඳුන්පතිරණ මහතාගේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ මා විසින් නිර්මාණය කරන ලද ප්‍රායෝගික කොටස් ඇතුළත් ඉගෙනුම් ආධාරක ද ඇතුළත් කර මෙය නිර්මාණය කරන ලදි. මෙහි ඇතුළත් ප්‍රායෝගික අන්තර්ගතයන් පටිගත කරන ලද්දේ පුද්ගලික ශබ්දාගාරයේ බැවින් (කිසිදු මූල්‍යමය ආධාරයක්, දීමනාවක් හෝ ප්‍රතිපාදනයක් නොලබා) තාක්ෂණික දෝෂ ඇතොත් ඒ පිළිබඳ ඔබගේ සුවිශේෂී අවධානය යොමුකරනු මැනවි.

එමෙන්ම මෙම ඉදිරිපත්කිරීම් සඳහා සහභාගී වූ මෙරට සංගීත අධ්‍යාපනයෙහි අත්දැකීම් සහිත අධ්‍යාපනඥයින් සහ ශිල්පීන් විසින් දක්වන ලද නොමසුරු දායකත්වය මෙහි සාර්ථකත්වයට බලපානලද බැවින් ඔවුන්ගේ සේවය අගයකළ යුතුය. එම සම්පත්දායකයින් ලෙස, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවරධනපුර විශ්ව විද්‍යාලය, යන විශ්ව විද්‍යාලයන්හි ආචාර්යවරුන් සහ සෞන්දර්ය විෂය අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් , ජ්‍යෙෂ්ඨ ගුරු මහත්ම මහත්මීන් සහ ප්‍රවීන සංගීතවේදීන් සහභාගී විය. ඉදිරියේ දී ද තව දුරටත් මෙම වෙබ් අඩවිය සංවර්ධනය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාමට අදහස් කර ඇත.

මෙම ඉගෙනුම් අවස්ථාව, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටීමේදී ප්‍රයෝජනවත් වන බැවින්, මෙම පොත සහ වෙබ් අඩවිය පරිශීලනයෙන් උපරිම ප්‍රයෝජනය ගෙන සාර්ථකත්වයට පත්වීම අපේක්ෂා කරමින් දැයේ දරු දැරියන් හට තිළිණ කරමි.

කපිල පතිරත්න (ගුරු උපදේශක)
කලාප අධ්‍යාපන කාර්යාලය - ගිරිඋල්ල

ප්‍රායෝගික කොටස් පරිශීලන සඳහා පහත Link එක හෝ QR කේතය භාවිත කරන්න.

https://sites.google.com/view/grade-11-music/home

(01) ප්‍රශ්නයේ 2. කොටස සඳහා

ප්‍රශ්නය - පරීක්ෂක විසින් ගයනු/වයනු ලබන සරල ගීතය සඳහා වාදනයට සුදුසු හින්දුස්ථානී තාලය හඳුනාගෙන නම් කිරීම.

- **ඉහත නම් කළ තාලයේ තාල පදය විභාග අනුව වෙන්කර ලිවීම.**
- **ඉහත තාලයට ගැලපෙන වෙනත් ගීතයක මුල් පාදයක් ලිවීම.**
- **ඉහත තාලයට සමාන දේශීය තිත නම් කිරීම.**

විෂය නිර්දේශයට අයත් හින්දුස්ථානී තාල

ලාවනී තාලය

තාල සංඥා	X		2		0		3	
මාත්‍රා	1	2	3	4	5	6	7	8
ධේකාව	ධා	ගෙ	න	ති	න	ක	ධි	න

දාදරා තාලය

තාල සංඥා	X			0		
මාත්‍රා	1	2	3	4	5	6
ධේකාව	ධා	ධි	නා	ධා	තූ	නා

කෙහෙර්වා තාලය

තාල සංඥා	X				0			
මාත්‍රා	1	2	3	4	5	6	7	8
ධේකාව	ධ	ගෙ	න	ති	න	ක	ධි	න

ත්‍රී තාලය

තාල සංඥා	X				2				0				3			
මාත්‍රා	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16
ධේකාව	ධා	ධිං	ධිං	ධා	ධා	ධිං	ධිං	ධා	ධා	තිං	තිං	තා	තා	ධිං	ධිං	ධා

ජප් තාලය

තාල සංඥා	X		2			0		3		
මාත්‍රා	1	2	3	4	5	6	7	8	9	10
ධේකාව	ධි	නා	ධි	ධි	නා	ති	නා	ධි	ධි	නා

දීප්චන්දී තාලය

තාල සංඥා	X			2				0			3			
මාත්‍රා	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
ධේකාව	ධා	ධිං	-	ධා	ධා	ධිං	-	තා	තිං	-	ධා	ධා	ධිං	-

බෙම්ටෝ තාලය

තාල සංඥා	X		0	
මාත්‍රා	1	2	3	4
ධේකාව	ධින්න	ධිනක	තින්න	ධිනක

කපිල පතිරත්න ගුරු උපදේශක

දේශීය තිත් සහ බෙර පද

සුළු තනි තිත

තිත් සංඥා	/	/	/	/
මාත්‍රා	1 2	1 2	1 2	1 2
උඩරට බෙර පදය	ඩ්‍රා මි	කි ට	කි ට	ඩ්‍රා මි

මැදුම් තනි තිත

තිත් සංඥා	/	/
මාත්‍රා	1 2 3	1 2 3
උඩරට බෙර පදය	ඩ්‍රා ං පි	පි ග ත

මහ තනි තිත

තිත් සංඥා	/	/
මාත්‍රා	1 2 3 4	1 2 3 4
උඩරට බෙර පදය	ඩ්‍රා ඩ්‍රා ං ත	ත කු ඩ්‍රා ං

සුළු මැදුම් දෙතිත

තිත් සංඥා	∧	/	∧	/
මාත්‍රා	1 2	1 2 3	1 2	1 2 3
උඩරට බෙර පදය	ඩ්‍රා ං	පි ං ත	ග ත	ඩ්‍රා ං ත

මැදුම් මහ දෙතිත

තිත් සංඥා	∧	/	∧	/
මාත්‍රා	1 2 3	1 2 3 4	1 2 3	1 2 3 4
උඩරට බෙර පදය	ඩ්‍රා ං ඩ්‍රා	පි ං ග ත	පි ග ත	ඩ්‍රා ං ත කු

සුළු මහ දෙතිත

තිත් සංඥා	∧	/	∧	/
මාත්‍රා	1 2	1 2 3 4	1 2	1 2 3 4
උඩරට බෙර පදය	ඩ්‍රා ං	ඩ්‍රා ං පි ං	පි ං	ග පි ග ත

කපිල පතිරත්න ගුරුවරයා

(01) ප්‍රශ්නයේ 3. කොටස සඳහා

ප්‍රශ්නය :

පරීක්ෂක විසින් ගයනු ලබන නිර්දේශිත රාගයකට අයත් ස්වර සංගතියක් හෝ දෙකක් ශ්‍රවණය කර, රාගය හඳුනාගෙන එම රාගය ආශ්‍රිතව අසනු ලබන ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම.

- **රාගයේ නම**
- **ආරෝහණය සහ අවරෝහණය**
- **රාගයේ විශේෂ ලක්ෂණයක්**

රාගය	මේලය	ආරෝහණය අවරෝහණය	වාදී	සංවාදී	මුඛ්‍යාංගය	ගායන සමය	විශේෂ ලක්ෂණ සහ ස්වර සංගති
බිලාවල්	**බිලාවල්**	ස රි ග ම ප ධ නි ස් ස් නි ධ ප ම ග රි ස	ධ	ග	ගරි,ගප,ධ, නිස්	**දිවා ප්‍රථම ප්‍රහරය**	• **ස්වර 7ම යෙදෙන අතර සියළුම ස්වර ශුද්ධව යෙදේ** • සරිස,මගමරිස • ගප ධනිස් • ගමප,ගමරිස
භූපාලි	**කළ්‍යාණ**	ස රි ග ප ධ ස් ස් ධ ප ග රි ස	ග	ධ	ගරිසධ, සරිගපග ධප,ගරිස	**රාත්‍රී ප්‍රථම ප්‍රහරය**	• **ස්වර 5ක් යෙදෙන අතර සියළුම ස්වර ශුද්ධව යෙදේ** • සධ,සරිග • ස්සධප,ගරිස • ගපධප,ගරිස
යමන්	**කළ්‍යාණ**	ස රි ග ම ප ධ නි ස් ස් නි ධ ප ම ග රි ස	ග	නි	නිරිගරිස, පමගරිස	**රාත්‍රී ප්‍රථම ප්‍රහරය**	• **ස්වර 7ම යෙදෙන අතර මධ්‍යමය තීව්‍ර වේ** • නිධ,නිරිස • නිධනිරි,ගරිස • පරිස,නිධ,නිරිස
හෙරවී	**හෙරවී**	ස <u>රි</u> <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> ස් ස් <u>නි</u> <u>ධ</u> ප ම <u>ග</u> <u>රි</u> ස	ම	ස	ම<u>ග</u>,සරිස, <u>ධ</u><u>නි</u>ස	**දිවා ප්‍රථම ප්‍රහරය**	• **ස්වර 7ම යෙදෙන අතර <u>රි</u>,<u>ග</u>,<u>ධ</u>.<u>නි</u> ස්වර කෝමලව යෙදේ** • ස<u>රි</u><u>ග</u> ම,<u>ග</u>රිස • සරි<u>ස</u><u>ධ</u>,<u>නි</u>සරි<u>ග</u> • <u>නි</u>ස<u>ග</u> ම,<u>ග</u><u>රි</u>ස • ස<u>නි</u><u>ධ</u><u>නි</u>,ස<u>රි</u>ස
කාෆි	**කාෆි**	ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස් ස් <u>නි</u> ධ ප ම <u>ග</u> රි ස	ප	ස	සස,රිරි, <u>ග</u><u>ග</u> මම,ප	**රාත්‍රී දෙවන ප්‍රහරය**	• **ස්වර 7ම යෙදෙන අතර <u>ග</u> සහ <u>නි</u> ස්වර කෝමලව යෙදේ** • රි<u>නි</u><u>ධ</u><u>නි</u>,පධමප • රි<u>ග</u>රිම,<u>ග</u>රිස • ස,රි<u>ග</u>,සරිප

(02) සහ (03) ප්‍රශ්න සඳහා අදාළ රාග සර්ගම් ගීත, ලක්ෂණ ගීත සහ මධ්‍යලය ගීත

ප්‍රශ්න අංක 02

බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන් යන නිර්දේශිත රාග අතුරෙන් කැමති රාගයක ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක්/වාදිතයක්, ගායනය/වාදනය කිරීම.

ප්‍රශ්න අංක 03

නිර්දේශිත රාග අතුරින් පරීක්ෂක මණ්ඩලය විසින් නම් කරනු ලබන රාග දෙකෙන් කැමති එක් රාගයකට අයත් සර්ගම් ගීතයක් හෝ ලක්ෂණ ගීතයක් ගායනය/වාදනය කිරීම සහ එම රාගයට අදාළව පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ස්වර බණ්ඩය ඒ ආකාරයෙන්ම ඔබ විසින් අනුකරණය කරමින් ගායනය/වාදනය කිරීම.

(ඉහත 02 ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කළ රාගය මෙහිදී නම් නොකෙරේ)

බිලාවල් රාගය

බිලාවල් රාගය සර්ගම්

ස්ථායි	3	X	2	0
	ග ප ධ නි	ස් – ධ ප	ම ග ම රි	ස රි ස –
	ග – ම රි	ග ප ධ නි	ස් නි ධ ප	ම ග රි ස
අන්තරා	ප ප ධ නි	ස් – ස් ස්	ධ නි ස් රිං	ස් නි ධ ප
	ග් රිං ස් නි	ධ ප නි ධ	ස් නි ධ ප	ම ග රි ස

කපිල පතිරත්න
ගිහිදෙල්ල ප්‍රදේශය

රාගය - බිලාවල් - ලක්ෂණ ගීතය - තාලය ත්‍රිතාල්

ස්ථායි

X				2				0				3			
ස	ස	ග	ම	රි	ග	ප	–	ධ	ප	ම	ග	ග	ම	ප	–
ස	පි	රු	ණු	ර	ති	යේ	s	සු	ගැ	යෙ	න	උ	ද	යේ	s
ධ	නි	ස්	නි	ධ	ප	ම	ග	ග	රි	ග	ම	රි	රි	ස	–
ජ	න	ක	බි	ලා	s	ව	ල	සැ	ම	ස්ව	ර	සු	දු	වේ	s

අන්තරා

ග	ප	ධ	නි	ස්	–	ස්	ස්	ස්	රිං	ස්	නි	ධ	නි	ප	–
ග	ප	ධ	නි	ස්	s	ය	න	ස්ව	ර	ස	ං	ග	නි	වේ	s
ධ	නි	ස්	නි	ධ	ප	ම	ග	ග	රි	ග	ම	රි	රි	ස	–
ධා	s	ස්ව	ර	වා	s	දී	s	ග	s	ස	ං	වා	s	දී	s

භූපාලි රාගය සර්ගම්

	0	3	X	2
ස්ථායි	ස් ස් ධ ප	ග රි ස රි	ග – ප ග	ධ ප ග –
	ග ප ධ ස්	රි ස් ධ ප	ස් ප ධ ප	ග රි ස –
අන්තරා	ග ග ප ධ	ප ස් – ස්	ධ ධ ස් රි	ග් රි ස් ධ
	ග් ග් රි ස්	රි් රි් ස් ධ	ස් ස් ධ ප	ග රි ස –

රාගය - භූපාලි - ලක්ෂණ ගීතය - තාලය ත්‍රිතාල්

ස්ථායි

0				3				X				2			
ස්	–	ධ	ප	ග	රි	ස	රි	ස	ධ	ස	රි	ග	රි	ස	–
රා	s	ගි	නි	ඔෆ	s	ඩ	ව	ග	ය	මු	භූ	s	පා	s	ලි
ග	ග	ග	රී	ග	ප	ධ	ස්	ධ	ප	ග	රි	ග	රි	ස	–
ක	ළ	ණ	මේ	s	ල	ග	ත	ශා	න්	ත	ර	ස	දා	s	යි

අන්තරා

ග	–	ප	ධප	ස්	–	ස්	–	ස්	රි්	ග්	රි්	ස්	රි්	ස්	ධ
ග	s	ස්ව	රs	වා	s	දී	s	ධ	s	ස	ං	වා	s	දී	s
ග්	රි්	ස්	රි්	ස්	ධ	රි්	ස්	ධ	ප	ග	රි	ග	රි	ස	–
ම	s	නි	s	හැ	ර	රෑ	s	පෙ	ර	ය	ම	ගැ	යෙ	නා	s

කපිල පතිරත්න ගුරුවරයා

යමන් රාගය සර්ගම්

	0	3	X	0
ස්ථායි	නි ධ – ප	ම් ප ග ම්	ප – – –	ප ම් ග රි
	ස රි ග රි	ග ම් ප ධ	ප ම් ග රි	ග රි ස –
	නි් රි ග ම්	ප ධ නි ස්	රි් ස් නි ධ	ප ම් ග ම්
අන්තරා	ග ග ප ධ	ප ස් – ස්	නි රි් ග් රි්	ස් නි ධ ප
	ග් රි් ස් නි	ධ ප නි ධ	ප ම් ග රි	ග රි ස –
	නි් රි ග ම්	ප ධ නි ස්	රි් ස් නි ධ	ප ම් ග ම්

රාගය - යමන් - ලක්ෂණ ගීතය - ත්‍රී තාල්

ස්ථායී	0 ග රි නි රි නි ති වි ඳු ස රි ස නි ය න ඵ න	3 ස - නිරි ගම් මෝ s සුම ධුර ප ධ නිරි සඃ ස්ව ර ගෙ නඃ	x ප ම ග ප ය ම න රා නිරි ගම් පධ නිඃ නිරි ගම් පධ නිඃ	2 රි ග රි ස s ග රි ස නිධ පම් ගරි ස නිධ පම් ගරි ස
අන්තරා	ග - ප- ධප ගා s ස්ව රඃ ප ග රි ස ක ළ ණ මේ 0	ඃ - ඃ - වා s දි s නි ධ නි ධ s ල ග ක 3	නි රි නි ඃ නි s ස 0 ප ම ග ප පි රු ණු නි x	නි ධ ප - // වා s දී s // රි ග රි ස ස ගැ යෙ න 2

හෙරවී රාගය සර්ගම් - 01

ස්ථ	0	3	X	0
	ස ධ ප ධ	ම ප ග ම	නි ධ – ස	– රි ග ම
	ග රි ස –	ධ නි ස රි	නි ස ම ම	ග ග රි ස
තරා	නි ස ග ම	ධ ම ධ නි	ඃ – ඃ –	ග් ග් රී් ඃ
	නි ඃ ග් ම්	ප් ග් – ම්	ග් රී් ඃ –	ග් ග් රී් ඃ
	ඃ ඃ නි නි	ධ ධ ප ප	ම ම ග ග	රි රි ස –

හෙරවී රාගය සර්ගම් - 02

ස්ථ	X	0	X	0
	ම ග රි	ස රි නි	ස – ධ	නි ස –
	ස රි ග	ම ප ධ	ප ම ග	රි ස –
අන්තරා	ධ ම ධ	නි ඃ –	ධ නි ඃ	රී් ඃ –
	ඃ ග් රී්	ඃ නි ධ	ප ම ග	රි ස –

රාගය - හෙරවී - ලක්ෂණ ගීතය - ත්‍රී තාල්

ස ප ප	ප ප ප	ප ධ ප	ම ම ම
ස පි රු	ණු මේ ස	රා ස ග	හෙ ර වි
ස ගු ම	ප ගු ම	ගු ගු රි	ස - -
ග ය මු	ව ය මු	සු මි හි	රී ස ස
ස - නි	ස ධ නි	ස ස සගු	ම ම ම
ස්ව ර සැ	ම යෙ දෙ	නා ස කෝ	ස ම ල
ස ගු ම	ප ගු ම	ගු ගු රි	ස - -
බැ තිං සි	රී ග ර	ර ස දි	දී ස ස
x	0	x	0
අන්තරා			
ධ - ම	ධ ධ නි	ස - නි	රි ස -
මා ස ස්ව	ර වා ස	දී ස ගා	ස ස්ව ර
නි - නි	ස ස ස	නිස රිස නිධ	ප ප ප
ස ං වා	ස දි ය	ලෙ සස යෙ	දේ ස ස
ස ස ස	නි නි නි	ධ ධ ම	ධ ප ප
දි න යෙ	ප ළ මු	ප්‍ර හ ර	යෙ දී ස
ස ගු ම	ප ගු ම	ගු ගු රි	ස - -
මෙ ය ගැ	යු ම ට	සු දු සු	වේ ස ස
x	0	x	0

කපිල පතිරත්න ගිරිඋල්ල කලාපය

කාෆි රාගය සර්ගම් - 01

	X	0	X	0
ස්ථායි	නි ධ ම	ප ග රි	ස රි ග	ම ප –
	ප ධ ම	ප ස් නි	ධ ප ම	ග රි ස
අන්තරා	ප ධ ම	ප ධ නි	ස් රි ග්	රි ස් –
	ධ නි ස්	රි ග් රි	ස් රි නි	ධ ප –
	ප ධ ම	ප ස් නි	ධ ප ම	ප ග රි
	ස ස රි	රි ග ග	ම ම ප	ධ ප ම

කාෆි රාගය සර්ගම් - 02

	X	2	0	3
ස්ථායි	ස ස රි රි	ග ග ම ම	ප – – ම	ප ධ නි ස්
	නි ධ ප ම	ග ග රි රි	රි ප ම ප	ම ග රි ස
අන්තරා	ම ම ප ධ	නි නි ස් –	රි ග් රි ස්	නි ධ නි –
	ධ ධ ප ප	ප ධ ප ම	ප – – ම	ප ධ නි ස්
	නි ධ ප ම	ග ග රි රි	රි ප ම ප	ම ග රි ස


රාගය - කාෆි - ලක්ෂණ ගීතය - ත්‍රී තාල්

	0	3	X	2
ස්ථායි	ස – රි ග	රි ග ස රි	ප – – ම	ග රි ස නි
	රා S ග ය	කා S ෆී S	වේ S S ය	සු ම දු ර
	ස ස රි රි	ග – ම –	නි – ධ ම	ප ප ප ප
	ස්ව ර දෙ ක	ගා S හා S	නී S කෝ S	ම ළ ව න
	නි නි ධ ප	ධ ධ ප ම	නි ධ ප ම	ග – රි –
	දෙ ව න ස	ම යෙ රෑ S	පූ S ර ණ	ජා S නි ව
	ප – ස් –	ප – ග රි	රි ග රි ම	ග රි ස –
	ප - ස -	වා S දී S	ස ං වා S	දී S වේ S
	0	3	X	2
අන්තරා	ම ම ප ධ	ම ප නි ස්	රි් ග් රි් ස්	රි් නි ස් –
	ම ම ප ධ	ම ප නි ස්	අ කු රු ඇ	ර ඹෙ නා S
	නි ප ග –	රි ග ම ප	ස් – නි ධ	ප ම ග රි
	නි ප ග –	රි ග ම ප	ආ ං ගි ක	ස්ව ර වේ S
	ස රි ග ම	ප – – –	ප ම ග රි	ස – – –
	ආ S රෝ S	හේ S S S	අ ව රෝ S	හේ S S S
	ස රි ග ම	ප ධ නි ස්	නි ධ ප ම	ග රි ස –
	ස රි ග ම	ප ධ නි ස්	නි ධ ප ම	ග රි ස –


කපිල පතිරත්න ගුරුවරයා කලාපය

බිලාවල් රාගය

බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්



බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්



කපිල පතිරත්න ගුරුලම්ම කලාපය

බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

ස්ථායි

3				X				2				0			
ප			ධ					නි							
ග	ප	නි	නි	ස්	–	ස්	ස්	ස්	ර්	ස්	නි	ධ	ප	මග්‍ර	මර්‍රි
තූ	ස	හි	අ	ධා	ස	ර	ස	ක	ල	ත්‍රි	භූ	ව	න	ක්‍රෝ	ස්‍ස
ග	ම	ප	මග	ම	ර්	ස	–	ධ	නි	ස්	නි	ධ	ප	මග්‍ර	මර්‍රි
ම								නි							
පා	ස	ල	ක	ස	ච	රා	ස	ච	ර	භූ	ස	ත	න	ක්‍රෝ	ස්‍ස

අන්තරා

3				X				2				0			
ප	–	නි	නි	ස්	–	ස්	–	ස්	ග්	ග්	ම්	ග්	ර්	ස්	ස්
තූ	ස	හී	ස	වි	ෂ්	ණු	ස	තූ	ස	නා	ස	රා	ස	ය	න
ස්	–	ග්	ර්	ස්	–	ධ	ප	ධ	නි	ස්	ස්නි	ධ	ප	මග්‍ර	මර්‍රි
කා	ස	ර	න	තූ	ස	ප	ර	බ්‍ර	හ්	ම	ජ	ග	ත	ක්‍රෝ	ස්‍ස

බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

ස්ථායි

2				0				X				3			
ස	ර්	ග	ම	ග	ර්	ග	ප	–	නි	ධ	නි	ස්	–	–	–
මු	ර	ලි	බ	ජා	ස	වේ	ස	ස	මෝ	ස	හ	නා	ස	ස	ස
ස්	–	ධ	ප	ධ	–	(ම)	ග	ර්	ග	ම	ප	ම	ග	ර්	ස
භූ	ස	ල	ග	ඊ	ස	ස	බ	සු	ධ	සු	ධ	මෝ	ස	ම	න

අන්තරා

								ප	–	ප	ප	ධ	–	නි	නි
								බ	ං	සු	ර්	කී	ස	ධු	න
ස්	ස්	ස්	–	ස්	ර්	ස්	ස්	ධ	නි	ස්	ර්	ස්	නි	ධ	ප
සං	ග	නා	ස	ච	න	ස	බ	චෝ	මි	ච	න	න	න	න	න
ධ	–	ම	ග	ම	ර්	ග	ප	–	ධ	–	නි	ස්	–	–	–
පා	ස	ය	ල	බා	ස	ස්වේ	ස	ස	මෝ	ස	හ	නා	ස	ස	ස
ස්	–	ධ	ප	ධ	–	ම	ග	ර්	ග	ම	ප	ම	ග	ර්	ස
භූ	ස	ල	ග	ඊ	ස	ස	බ	සු	ධ	සු	ධ	මෝ	ස	ම	න

කපිල පතිරත්න ගුරුවරයා


බිලාවල් රාගය සඳහා ගායනය/වාදනය කළහැකි මාත්‍රා අටකින් යුතු තානාලංකාර

1. ගප් ධනි් ස්නි් ධප් | මග් මරි් සරි් ස– |
2. සරි් ගම් ගරි් ගප් | ගම් පග් මරි් ස– |
3. ගප් ධනි් ස්ර්් ස්නි් | ධප් මග් මරි් ස– |


සැකසුම :- කපිල පතිරත්න (ගුරු උපදේශක)

භූපාලි රාගය

භූපාලි රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්



භූපාලි රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්



කපිල පතිරත්න ගුරුමුල

රාගය - භූපාලි - මධ්‍යලය ගීතය - තාලය ත්‍රිතාල්

ස්ථායි

0				3				X				2			
ග	රි	ග	රි	ස	රි	ස	ධ	–	ස	–	රි	ග	–	–	–
ජ	බ	සේ	s	තු	ම	ස	නා	s	ලා	s	ග	ලී	s	s	s
ප	ග	ප	ප	ප	ධ	ප	ග	ප්‍රග	ප	ස්ධ්‍ර	ස්	ප්‍රධ	ස්ස්	ධ්‍රප	ග්‍රරි
පී	s	ත	න	වේ	s	ලී	s	ප්‍රා	රේ	බල්	මා	ඝඝ	ඝඝ	මොඝ	රිඝ

අන්තරා

								ග	ග	ග	ග	ප	ප	ස්	ධ
								ජෝ	s	නේ	s	න	න	නා	s
ස්	ස්	ස්	ස්	ස්	රී	ස්	–	ස්	රී	ග්	රී	ස්	රී	ස්	ප්‍රධ
දේ	s	කෝ	s	තෝ	s	හේ	s	ක	ල	න	ෆ	ර	ත	මෝ	හෙඝ
ස්	–	ධ	ප	ග	රි	ග	ධ	ස්ධ්‍ර	ස්	ප්‍රධ්‍ර	ස්	ධ	ප	ග	රි
චා	s	චා	ක	රේ	s	ස	බ	ස්‍රේඝ	s	ඝඝ	s	ල	රි	යා	s

රාගය - භූපාලි - මධ්‍යලය ගීතය - තාලය ත්‍රිතාල්

ස්ථායි

0				3				X				2			
ධ ස්	ස්	ධ	ප	ග	රි	ස	ස	ස් ප	ග	ප	ප	ප	ධ	ප ධ	–
ෂ	ත	නෝ	ජෝ	බ	න	ප	ර	මා	s	න	න	ක	රි	ර්‍යේ	ඝ
ප ග	ග	ග	රි	ග	ප	ධ	ස්	ස්ප්‍ර	ධ	ස්	ස්	ස්ස්	ධ්‍රප	ග්‍රරි	ස්‍ර–
ඩ	රි	යේ	s	ප්‍ර	භූ	සෝ	s	ආඝ	s	s	ජ	ආඝ	ඝඝ	ඝඝ	ලිඝ


අන්තරා

ප ග	–	ග	ග	ප	–	ස්	ධ	ස්	ස්	ස්	–	ස්	රී	ස්	–
ජෝ	s	කෝ	ෂ	ආ	s	වේ	s	අ	ප	නේ	s	ඩිං	s	වා	s
ස් ධ	–	ස් ධ	–	ධ ස්	ස්	රී	රී	ධ ස්	රී	ග්	රී	ධ ස්	(ස්)	ධ	ප
කා	s	සෝ	s	ග	ර	බ	න	කී	s	s	පි	යේ	s	s	s
ප	ග	රි	ප ග	ප	ධ	ස්	ස්	ස් ප	ධ	ස්	ස්	ස්ස්	ධ්‍රප	ග්‍රරි	ස්‍ර–
ස	දා	s	රං	s	ග	ය	හ	රී	s	s	ත	මඝ	ඝඝ	ඝඝ	නේඝ


භූපාලි රාගය සඳහා ගායනය/වාදනය කළහැකි මාත්‍රා අටකින් යුතු තානාලංකාර

1. ග්‍රග් රිස් සරි් ගප් | ධප් ගප් ගරි් ස– |
2. සරි් ගරි් ගප් ධප් | ස්ස් ධප් ගරි් ස– |
3. සරි් ගප් ධප් ගප් | ගප් ධප් ගරි් ස– |

කපිල පතිරත්න ගුරුවරයා



යමන් රාගය - මධ්‍යලය ගීතය 02 - තාලය ත්‍රී තාල්



යමන් රාගය - මධ්‍යලය ගීතය 03 - තාලය ත්‍රී තාල්

0	3	X	2
ග රි ස –	නි රි ස –	ප ම් ග රි	ග – – –
දි නි දා S	අ ව රේ S	බෑ ස ය න්	නේ S S S
නි රි ග ම්	ප ම් ග ප	රි රි ග රි	ස – – –
ම ද අ ඳු	රේ S ලො ව	නෑ හෑ වෙ න්	නේ S S S
ග ග ප ධ	ස් – ස් –	නි ධ නි ර්ි	ස් – – –
පෙ ල ගෑ සෙ	මි න් ව වු	ලෝ S ඇ දෙ	තී S S S
නි ර්ි ග් ර්ි	ස් ස් නි ධ	ම් ප නි ධ	ප – – –
බ් ළි දෝ S	ම ව් තු රු	ලේ S නි ද	තී S S S
ග් ර්ි ග් ර්ි	නි ර්ි ස් –	නි ධ නි ධ	ම් ධ ප –
සී S ත ල	සු ළ ගි න්	ග ත සි ත	පි න ව යි
ග – ග රි	ග ම් ප ධ	ග රි නි රි	ස – – –
සෝ S බ න	මේ S සෑ න්	දෑ S යා S	මේ S S S

යමන් රාගය සඳහා ගායනය/වාදනය කළහැකි මාත්‍රා අටකින් යුතු තානාලංකාර

1. නිරි ගම් පධ නිස් | නිධ පම් ගරි ස- |
2. ගම් පධ පම් ගම් | ගම් පම් ගරි ස- |
3. ගම් පධ නිධ පම් | පම් ගම් ගරි ස- |
4. නිරි ග- රිග ම- | ගම් පම් ගරි ස- |

හෙරවී රාගය

හෙරවී රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

- ග - රි s ගී s ත - ග - රි s ගී s ත 0	ස - ධ නි නා s ද ඈ ස - ධ නි නා s ද ඈ 3	ස - - - සේ s s s ස - - - සේ s s s	ස රි ග ම ම නහ ර ස රි ග ම ම නහ ර - - - - s s s s 2
ස ප ප ප අ රු ත ට ස ධ ප ධ හැ ඟු මැ නි - ග - රි s ගී s ත ධ ම ධ නි වි දු ද න ස ධ ප ධ හැ ඟු මැ නි 0	ප ප ප ප ගෑ ල පෙ න ම ප ම ග ම තු ක ර ස - ධ නි නා s ද ඈ ස් - ස් ස් ර ඳ ව න ම ප ම ග ම තු ක ර 3	ප ධ නි ස් ස්ව ර ස මු ම - - - නා s s s ස - - - සේ s s s නි - ස් ස් අ ම ර ස ම - - - නා s s s x	ධ නි ධ ප දා s යෙහි ස රි ග ම ම න හ ර - - - - s s s s ධ නි ධ ප ද න ව න ස රි ග ම ම න හ ර 2

කපිල පතිරත්න සංගීතය

හෙරවී රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

ඝ ත ත බු	ත්‍රම ත ග්‍රු ම	ත නි බු ප	ම ග්‍රු ර්‍රි ස
අ ද්‍රි ර ඝ	ස්‍යූ ර ණි ය	ම ව ඵ ණෙ	නෙ ය් නෙ ය
×	২	০	৩
ර්‍රි ග්‍රු - ම	ග්‍රු ර්‍රි ඝ -	ත බු නු ස්	ප නු බු ප
නැ නේ ය ය	ණ් ණි ද්‍රි ය	අැ ය ඝ ම	ආ ය ලේ ය
×	২	০	৩

අන්තරා

බු ම බු නු	ඝ් - ඝ් ඝ්	නු නු ඝ් ඝ්	නු ඝ්‍රු නු බු ප
ච් න් ද ණ	ටු ත ප ක්	ද රු වෙ ණි	ඝා ය්‍රූ මේ ය
×	২	০	৩
ඝ ත ත ත	ත බු නු ස්	ත නු බු ප	ම ග්‍රු ර්‍රි ඝ
ලේ ය ණ ර්	ණ ර ණෙ ව	ලා ය ද් ප	නැ දු නේ ය

කපිල පතිරත්න
ගීතාචාර්ය කලාපය

හෙරවී රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

	3	x	2	0
ස්ථායි	ස	නි	ම ග	ග
	නි ස ග ම	ධ - ප -	ග - ප ම	ර්‍රි - ස -
	අ බ තො රි	බා s කී s	ලෝ s අ නි	යා s රේ s
	ස	නි		ප
	නි ස ග ම	ධ - ප -	ධ ධ ප ප	ධ නි ධ ප
	අ බ තො රි	බා s කී s	චි ත ව න	මෙ රො ම න
	ම	ම		
	ම ප ග ම	ධ - ප ග	- ග ප ම	ග ර්‍රි ස ර්‍රි
	බ ස කි නො	ප්‍රා s රෙ පා	s රෙ බ කි	යං ක ර කෙ
අන්තරා				
	ප		ස්	
	ධ ම ධ නි	ස් - ර්‍රි ස්	නි නි ස් ස්	ර්‍රි නිස් ධ ප
	ස න ද ක	හේ s මො ර	ජී ය න හි	මා ss නේ s
	ප ග්	නි	ම ග	
	ග් - - ර්‍රි	ස් ධ - ප	ග ග ප ම	ග ර්‍රි ස ර්‍රි
	ඩා s ර් දි	නො මෝ s පෙ	ජ දු ස ක	චු ක ර කෙ
	3	x	2	0

හෙරවී රාගය සඳහා ගායනය/වාදනය කළහැකි මාත්‍රා අටකින් යුතු තානාලංකාර

1. නි̇ස ග්‍රම පධ නිස්̇ | නිධ පම ග්‍රරි̇ ස- |
2. පම ග්‍රම පධ නිස්̇ | නිධ පම ග්‍රරි̇ ස- |
3. නි̇ස ග්‍රම පග්‍ර -ම | ග්‍රරි̇ ස- නි̇ස ග්‍රම |
4. නි̇ස ග්‍රම පනි̇ ධප | නිධ පම ග්‍රරි̇ ස- |

කාෆි රාගය


කාෆි රාගය - මධ්‍යලය ගීතය - තාලය ත්‍රී තාල්

ස ස රි රි	ග ග ම ම	ප - - ම	ප ධ නි̇ ස̇
ස ද ව ක	හි ඇ හෙ න	වා ය ය නි	නා ය ශී ය
০	෩	×	২
නි ධ ප ම	ග ග රි රි	රි ප ම ප	ම ග රි ණ
ම ච් ඛි ම	සි බ සි ධ	නැ ළ බෙ න	ඒ ය ලේ ය
০	෩	×	২

අන්තරා

ම ම ප ධ	නි නි ස̇ -	රි ග්‍ර රි ස̇	නි̇ ධ නි̇ -
ඇ මෙ ත රු	ද රු ණෝ ය	අ ත් ඔ ස	ත ය ලා ය
০	෩	×	২
ධ ධ ප ප	ප ධ ප ම	ජ - - ම	ප ධ නු̇ ණ̇
ම ණි නූ ය	මි ශ ව ඳි	කී ය ය ඛ	නා ය වී ය
০	෩	×	২
නි̇ ධ ප ම	ග්‍ර ග්‍ර රි රි	රි ප ම ප	ම ග්‍ර රි ස
නූ ටු ක ඳු	ලූ ල් ස ල	මි න් ණි ය	ණ ඝ කී ය

කපිල පතිරත්න ගුරුවරයා



අන්තරා

කාෆි රාගය සඳහා ගායනය/වාදනය කළහැකි මාත්‍රා අටකින් යුතු තානාලංකාර

1. සරි ගුගු රිගු මම | ගුම් පම් ගුරි සා- |
2. රිනි ධනි පධ මප | රිගු රිම් ගුරි සා- |
3. සස රිරි ගුගු මම | ප- පම් ගුරි සා- |
4. ගුම් පගු මප ගුම් | ගුම් පම් ගුරි සා- |

ප්‍රශ්න අංක 04

- සරල ගී හෝ චිත්‍රපටි ගීත (සිංහල, හිංදි)
- නාට්‍ය ගී හෝ ගීත නාට්‍ය ගී
- නූර්ති හෝ නාඩගම් ගීත
- ග්‍රැමෆෝන් ගී හෝ කණ්ඩායම් ගී

ඉහත සඳහන් ගීත කාණ්ඩ අතුරින් තෝරාගත් කාණ්ඩයේ සඳහන් ගීත වර්ග දෙක අතුරින් එක් නිර්දේශිත ගීතයක් ගායනය/වාදනය කිරීම.

(මෙහි දී අවශ්‍ය නම් ගායනය ප්‍රධානව තෝරාගත් අපේක්ෂකයින්ට වාදනයෙන් ද, වාදනය ප්‍රධානව තෝරාගත් අපේක්ෂකයින්ට ගායනයෙන් ද ඉදිරිපත් විය හැකිය.)

සරල ගී හෝ චිත්‍රපටි ගීත

සරල ගීත

අන්දර යායේ

අන්දර යායේ වැව් කාවල්ලේ
සක්මන් කරනා අප්පච්චී
දොළේ දියයි මට කෙතේ නිලයි
ගහ වැලේ මලයි මට අප්පච්චී....

වලාකුළේ දා බිඳු තවරා
මහ පොළොවට මහ වැසි ගෙනෙනා
දිවි ගමනේ ඉම කඳු මුදුනේ හිඳ
පිතු සෙනෙහේ කඳුළැලි සලනා....

කුරු හිස මුදුනේ මල් පලඳා
කැකුළු මුවට ඵල වැල නෙළුවා
ඒදඬු මං බැඳ සක්කුළුපවු බිඳ
සිදාදියට එන මං කැනුවා....

අන්දර යායේ....

ගීතය : රත්නදීප ජන්ම භූමි
පද රචනය : මහගම සේකර
සංගීතය හා ගායනය : විශාරද ඩබ්. ඩී. අමරදේව

රත්නදීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමිය යි

මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙළූ ලේ කඳයි

සින්ධූපමාන වැව් තලා මකින් ඇදී
පද්ම රේණුවෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි

ගංගා තරංග රාව දී රිදී වනින්
මල් පිපී කුළින් කුළේ හැපී
ගායනා කරන්නේ ආකාශයේ නැඟී
වීරයන්ගෙ ඒ යශෝ ගීතයයි

ධනිල පතිරත්න ගුරුවරයා

ගමට කලින් හිරු

ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා
ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා
ඒ මල් සුවඳේ අද ලොවුතුරු සුව විඳිනා
කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

රෑ කළුවර අරගෙන දරුවන් එන තුරු - සිත නෑ නිවන් දකින්නේ
රෑ කළුවර ඇවිදින් ඉකිබිඳ හැඬුවත් - නෙත නෑ නිදි විඳගන්නේ
හෙට අරුණට සැරසෙන තව දවසක් ගැන - නින්දේ සිහින දකින්නේ
මහමායාවෙනි කවදා දෝ ඔය නෙත් - දරු සෙනෙහසින් මිදෙන්නේ

වෙල් දෙණිවල ඇවිදින දෙපා රිදෙන විට - විහඟ ගීත බණ පද වේ වා
බෝ මළුවක ඇවිළෙන පහන් වැටක් සේ - තුන් සිත නිවී සැදේ වා
මතු උපදින සසරේ විසාකාව වී - මෙක් මඟ නෙත් හමු වේ වා
ඇත් රැජිනියනේ ඔබෙ නැළවිලි ගීතය - ලොව ම නිවන කවියක් වේ වා

නිල් අහස් තලේ අගේ

නිල් අහස් තලේ අගේ
නෑ වළාකුළු
ලස්සනයි පුරා හඳේ
රැස් විහිදිලා

නිල් නෙළුම් නිදා වැටේ
මානෙල් මල් පිපී
ලස්සනයි පුරා හඳේ
රැස් විහිදිලා

මල් විසිරීලා වගේ
තාරකා සිරි
ලස්සනයි පුරා හඳේ

ආදරයේ උල්පත වූ අම්මා

ආදරයේ උල්පත වූ අම්මා
මා ඔබගේ පුතු වූ
ඔබ මතු බුදු වන දවසේ
මා රාහුල කුමරුන් සේ
සෙවණ පතා අද මෙන් පැමිණෙන්නෙමි
සුළැඟිල්ලේ එල්ලී.....

සඳ දිය කොට - කිරි වතුරෙන්
ඒ දියරෙන් මුව සෝදා
දිව මතුරක් වන් නැළැවිලි ගීයෙන්
මතකයි මා නැළැවූවා
ජීවිතයෙන් ජීවිතයක් ගෙන දී
ඒ ජීවිතයට කිරි දී පණ දී
මා දැඩි කල අම්මා.....

තුරුළට ගෙන අත් පා හැඩ ගන්වා
නිදි ගන්වා යහන් ගැබේ
සිහිනෙන් ගෑ මුදු සුවඳක් මෙන්
සිහිවෙයි ඒ කිරි සුවඳ ඔබේ
දවසින් දවසට සෙනෙහස ළබැඳී
ගෙනදී දිවියට නව පණ ලැබදී
මා දැඩි කල අම්මා.....

අයන්න කියන්න ලොවටම ඇහෙන්න

අයන්න කියන්න ලොවටම ඇහෙන්න
එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න
එන්න මගේ මල්ලී
එන්න මගේ නංගී

පාසල නම් රන් දෙවොලේ
දෙවියන් වන් ගුරු කැළගේ
සිත දිනමින් පා හෙවණේ
ශිල්ප ලබා මතු දවසේ
ලෝකය දකින්න එහි සැරිසරන්න
එන්න මගේ මල්ලී
එන්න මගේ නංගී

කාසි පනම් හිටි හැටියේ
සතුරෝ ගෙන යති රහසේ
පොතින් පතින් ලද දැණුමේ
ධනය සදාකල් සුරැකේ
ඥානය වඩන්න කාලය ගෙවන්න
එන්න මගේ මල්ලී
එන්න මගේ නංගී

කපිල පතිරත්න ගුරු උපදේශක

බැස සීතල ගඟුලේ

බැස සීතල ගඟුලේ පින පින නාමුකෝ නගෝ
හඳපානේ.....හඳපානේ.....
බැස සීතල ගඟුලේ පින පින නාමුකෝ නගෝ

සීතල ජලය අගෙයි ගත සිත පිනයි පිනයි
පොඩිපොඩි රැළිද නගී රාසිරාසි පෙළ ගැසීගැසී
හඳපානේ.....හඳපානේ.....
බැස සීතල ගඟුලේ පින පින නාමුකෝ නගෝ

සමනල කන්ද පෙනේ කදිමට හඳ එළියේ
හනිකට බසිමු නගෝ නාමු නාමු ගිලෙමින ජලයේ

හඳපානේ.....හඳපානේ.....
බැස සීතල ගඟුලේ පින පින නාමුකෝ නගෝ

මානෙල් ඕලු නෙළුම් පිපිලා යසයි යසයි
නෙළමින පීනමුකෝ
ප්‍රීති ප්‍රීති වෙමින බෝ ලෙසේ
හඳපානේ.....හඳපානේ.....
බැස සීතල ගඟුලේ පින පින නාමුකෝ නගෝ

අක්කෙ අක්කෙ අර බලන්නකෝ

අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ
හෝ හෝ හෝ ගා ගෙන එන්නේ
ගස් ගල් පෙරලෙන්නේ...
සුළං තදයි විදුලියද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වළාකුළක් මේ එන්නේ

අක්කේ වී පැදුරත් මිදුලේ - අකුලා ගෙට ගනනේ
අම්මත් අර නාගෙන එන්නේ
අම්මත් අර නාගෙන එන්නේ
මල්ලි තවම කුඹුරේ.
සුළං තදයි විදුලියද කොටයි - හෙණ හඬ පැතිරෙයි
මහ වළාකුළක් මේ එන්නේ

නංගි සුදෝ මගෙ අඬන්නෙපා
අම්මා හනික දැන් එයි
බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ
අහසේ හෙන නාදේ
සුළං තදයි විදුලියද කොටයි - හෙණ හඬ පැතිරෙයි
මහ වළාකුළක් මේ එන්නේ

අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙනවනේ
වතුරත් ඉවරයි කළ ගෙඩියේ
හනික ලිඳට යමුකො
සුළං තදයි විදුලියද කොටයි - හෙණ හඬ පැතිරෙයි
මහ වළාකුළක් මේ එන්නේ

ඕලු පිපිලා විල ලෙලදෙනවා

ඕලු පිපිලා විල ලෙලදෙනවා-සුදට සුදේ නන්ගෝ
ඕලූ නෙලාලා මාල ගොතාලා
දෙන්නද සුදු නන්ගෝ
එන්න දියෙ බැස මා හා...දෙන්න ඔබේ අත මාලා
ඕලූ නෙලාලා.... මාල ගොතාලා
පලදිමු අපි මාලා

වැල නොකැඩී පෙම් කෙලිමින් යන්නෝ
දන්ඩි පැටව් නන්ගෝ
කූනිස්සො උඩ පැන පැන යන්නෝ
අප කැඳවා නන්ගෝ....
මෙන්න මලක් මා නෙලුවා....ඔන්න ඔබේ ඒ මාලා
ඕලූ නෙලාලා.... මාල ගොතාලා
පලදිමු අපි මාලා

මා පරදිනවා ඔබගේ දැතට මට ලජ්ජයි නන්ගෝ
හෙමිහිට හෙමිහිට නෙලමින් යමුකෝ
කලබල ඇයි නන්ගෝ
ඕලූ මලේ සුද නාලා, ඔබෙ රුව වැඩි වෙයි මාලා...
ඕලූ නෙලාලා.... මාල ගොතාලා පලදිමු අපි මාලා

දුනුකෙයියා මලක් වගේ

දුනුකෙයියා මලක් වගේ
දුරට පෙනෙනවා..
වැටකෙයියා මලක් වගේ
සුවඳ හමනවා..

පසළොස්වක සඳ වාගේ
එළිය ගෙනෙනවා..
මගේ අම්මා මට ජීවන
සුවය සදනවා...

සංසාරෙන් සංසාරෙට එකට ආ බැඳී..
කෙනෙක් නොමැත දරුවෙකු හට
මවක් සේ ලැදී..
අම්මා යන සමාධියට සිටිමි සමවැදී..
ඔබෙ ගුණ කීමට හෝඩියේ අකුරු මට මදී..

සිවු බුදුවරු දුටු ලෙස එක දිනයක පිම්මේ..

ඔබ දුටුවම මගෙ දුක්ගිනි නිවෙනව අම්මේ..

සක්විති රජ වරුනගෙ දණ ඔබ ලග නැම්මේ..

සිරිමහ බෝ මුල මතු දින බුදුවෙනු අම්මේ..

ධර්මදීපිකා ගීතවල්ල

චිත්‍රපටි ගීත

සුදු සඳ එළියේ නල මත පොපියන
හිරිමල් කැකුළෙක රොන් කෙමියේ
මුළු මල් වන ලොව ඉරණම සැතැපේ
කුළුගැන්වෙන තුරු හිමිදිරියේ

සමනළ තුඩෙකින් පිනිබිඳු පොදෙකින්
පණ ගැන්වෙන තුරු හිමිදිරියේ
පහන් දොරින් එන රැස් රේඛාවෙක
උණුසුම ඇසුරුව හිමිදිරියේ

ඉපැරණි කඳු යට සැඟවුණු මිණි කැට
පැන පැන බැස යන දිය දහරේ
ඇදී ඇදී හිඳ මතු වී එන විට
මැණික් තාරකාවලට හැරේ

ඕළු නෙළුම් නෙරිය රඟාලා
කිකිණි හඬන වලා නඟාලා//
ගඟුල් තොටිල්ලේ මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල් ගා
යමු නැළැවිල්ලේ නැළැවිල්ලේ නැළැවිල්ලේ
ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ//

කිරල කිරලි කුඩුවේ ලගී
කුරුලු පත්ති නාද දී නගී//
නැඹුරු වී බලා කුඩා සුදු වලා
ඔබේ රුවට වගී වෙලා නේ
යමු නැළැවිල්ලේ නැළැවිල්ලේ නැළැවිල්ලේ
ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ//

ඇත ගව් ගණන් දුරින් - ලෝකයේ නොයෙක් රටින්
පාවෙවී ආ විලාසිතා - දෙවිලියන් මැවූ විලාසිතා
ආරිච්චි බෝරිච්චි කම්බිකුරු බෝලමාල
ඒත් අතට මේත් අතට - අඟර දඟර සරුංගෝල
සරසවාල හැඩදමාල
පාට කරල මේ බලන්න
ආරිච්චි බෝරිච්චි කම්බිකුරු බෝලමාල

පුංචි ලංක දීපයේ
පැංචියන් ලවා අපේ - පාවෙවී ආ විලාසිතා
දෙවිලියන් මැවූ විලාසිතා

පත්තරෙන් ඇවිත් මෙහේ නැද්ද යම් කෙනෙක්
ගන්න ගන්න මාගෙ රූපෙ මං පොටෝ ජෙනික්
නම ද ගම ද වයස එක්ක පින්තූරෙ විස්තරේ
පත්තරේක වැටෙන කල් අනේ
රෑට නින්ද යන්නෙ නෑ අනේ

කුල ගෙදරින් දුම්බර කඳු වැටියේ
පති කුලයට අද කැන්දන් එනවා
දුම්බර මැණිකේ
මනු කුල සිරිතට පති කුලයට අද
කැන්දන් එනවා දුම්බර මැණිකේ
වාසනාවන් හරි වාසනාවන්//

වන ලන්දෙ හැංගුණ මූණු පොඩ්ඩක්
කෝල වෙයි ගම් මණ්ඩියේ
ගහ වැල් පිපී සුවඳින් පිරී
අද පෙම් කෙළී වැව් කණ්ඩියේ
වාසනාවන් හරි වාසනාවන්//

දඹ රත්තරන් හැඩ දා සොඳින් කළ
රූපයක් ඇඹුමක් වගෙයි ඔහෙ
ඇස්වහක් නැත හෝ වහක් නැත
ආකහේ තරුවක් වගෙයි
වාසනාවන් හරි වාසනාවන්//

කපිල පතිරත්න ගිරිල්ල ප්‍රලාපය

නාට්‍ය ගීත

සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වළාකැරලි පලසකි මේ
මග දිග ඇතිරු අහස සූරන මැදුරු

පාර දෙපැත්තේ සොඳුරු සල්පිල්වල
දෙව්ලොව නැති සැප විකුණන්නේ
නුවරු රිසි රිසි දේ ගෙන මසුරන්
තඹයට දෙන්නේ
නිබඳ සිත ලතැවෙන්නේ

ජේත්තුකාර ලියන්
ගත විලවුන් මුහුන සිඹින්නා
සාටක දුහුල ඉරන් නාරිලතා මල් පුදින්නා

දැසින් අමතන බස් වැසුනු දොරක් විවර
කරන්නේ
එලිපිට ඇත අවකෙලි කිසිවෙකු
මැසිවිලි නොකියන්නේ

සැණකෙලි පුරාහඳේ
නිකිනි අවන් හල් පිබිදෙන්නා
ඇසුවන් දුක් සින්දන ගී සින්දු සවන පිනන්නා
සතහට සෙත සලසා අතකින් මධුවිත
පුරවන්නේ
සවිදිය පුරන ලඳක්
රකුසු නෙතක් පාලු කපන්නේ

සුවඳ සබන් ඇඟ ගාලා හායි හායි
කුඹුකෙ ළිඳෙන් දිය ඇද.. නාලා....
හැඩ වැඩ වෙන්ත ඔයා ලස්සන සලු පලඳා
එනවා ඔබව සොයා

දීලා ....නෙතට අඳුන්
මාලා....පැලඳ කුසුම්
නීලා නයන කැලුම් දීලා නෙතග බැලුම්
නීලා නයන කැලුම් දීලා නෙතග බැලුම්
කැන් දන් යන් න තුටින්

පාලා.... අනඟ රැහුම් රාජා.....සමග ඉතින්
ඉන්නට ලැබෙන එකත් පෙර කල පිනකි
උතුම්
ඉන්නට ලැබෙන එකත් පෙර කල පිනකි
උතුම්
තෝරා ගන්න ඉතින්

යස ඉසුරු පිරුණු තැනා
සිරි දෙව්දූ සිටින තැනා..
ලඟම ඇතේ දුරක නැතේ...
අපි යන්නේ ඒ පාරේ..

යුක්ති ගරුක අතීතයට කැන්දන් යමි මම
දස රාජ ධර්ම කල - තෙජ වීර රජුන් දැක
ඇස් ඉදිරියෙ උඹ ලඟ
ඇස් ඉදිරියෙ උඹ ලඟ...

අතීතයේ ඉස්ටෝරුව එදා ඉදන් මම
නිදි මර මර මුර කොට-බහිරව බිලි පුද කොට
රැක ගත්තේ නුඹලට
රැක ගත්තේ නුඹලට

රජ වරු රජ මැතිවරු යස රාජ බිසෝවරු
කල කෙලි සෙල්ලම් දැක -තව කාසි දියන් මට
හොඳ තැගි දියන් මට...
හොඳ තැගි දියන් මට...

කපිල පතිරත්න සිදුවීම් කලාපය

පළමු ව මම වැන්ද බුදුන් සිහි කරගෙන ඒ ගුණ ක ඳ
දෙවනු ව සද්ධර්ම උතුම් මුදුනත් කර මෙන්න වැන් ද
තෙවනු ව මහ සංඝ රත්නෙ වැඳ සුරන්ට පින් දී සො ඳ
කියනව අපි නෙයින ගෙ සුදුව කවියෙන් කර ප්‍රබන් ද

සිරින් සපිරි අපෙ ලක්දිව අසුවුණි ඉංග්‍රිස් රජුන් ට
කෙළින් ඉන්න නොදී අපිට බලේ ගත්ත ඔවුන් අත ට
පිටින් ආපු හම්බ හෙට්ටි හැත්ත පිරුණ කොළොම් පුර ට
ඔවුන් අතර හිටිය නෙයින තම්බි කියල කෙනෙක් ජය ට

සොඳින් මසන් ගස් හන්දියෙ නෙයින උන්නු ගෙයි විස්ත ර
න ඟි න් ට එහි තට්ටු හතයි යටටත් ඒ තරම් විත ර
ත දි න් ම සුදුව එතනයි නිලධාරිත් ඇවිත් නිත ර
ප නි න් ට බෑ අල්ලන්නට ආණ්ඩුවත් බයයි මිතු ර

මෙකලා වීරයෙක් උන්න කොතලාවල කියල සොඳ ට
සි ත ලා වැඩ කරන එතුම ජෝන් තමින් පුරසිද්දෙ ට
ලැ බි ලා ගුරු තනතුරකුත් පසු ව ගියා රේල්ලුව ට
එ ක ලා ඔහු කළ දස්කම් කියනව මං පෙළින් පෙළ ට

නූර්ති ගීත

දූටුගැමුණු නූර්තිය
නිෂ්පාදනය
(නීතිඥ ජෝන්ද සිලිවා මහතා)

සුවඳ පද්ම ඕලු ආදි
නොයෙක පුෂ්පයෙන් සැදී
සරණ හංස සේරු බෝම
පොකුණු සීත පැන් පිරී

චතුර නාන නෙක් දනෝ
පැමිණ නාති ග්‍රීෂ්මයන්ට
මමද නාග ලෝකයෙන්ම
මෙපුර ආමි නාන සේ

පෙනෙති තූප මේ පුරේ
වඳිති ඊට දීප වාසි
රකිති ධර්ම සාක්‍ය වංස
මුනිඳු දේශනා ලෙසේ

නූර්තිය - රාමායණය

නිෂ්පාදක - නීතීඥ ජෝන් ද සිල්වා

අඹ දඹ නාරං කෙසෙල් දෙල්
පනා කකා මේ වනා සැපා ලබනෙම්
ගංගාවේ ඕලු ඇත්තෙ
ඒවායේ කෑම නැත්තෙ
ඇක්තෙ පුෂ්ප අත්තෙ අත්තෙ
ඒවා පිපෙයි

අඹ දඹ නාරං...

පක්ෂී නාදේ රැත් ඇසේවී
හීන් හඬ ම දෙත් නයි
මල්ලිකා වැල් බොහෝ තිබෙන්නා
විශාල මේ වනේ මම්
ප්‍රවේශම් බෝම වෙලා ඉන්නෙම්
වාසෙ සොඳා බැද්දෙ මෙදා
ප්‍රීති හදා වෙයි නිබඳා
බෝ මාදං ඇත්තේ මේ ගසේ

අඹ දඹ නාරං ...

නූර්ති නාට්‍යය - වෙස්සන්තර
නිෂ්පාදක - නීතිඥ ජෝන් ද සිල්වා
ගීතයට අදාළ චරිතය - ජූජක බමුණා

බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා
සිවි දේසේ වැසියො කිපී//
පන්නා මා ලූ ය මෙ වන//
බොදොස්.....
දාසින් ලබාගෙනා සම්බ වෙන්ට සුන්දරී//
යන්නටා හැකි වේදෝ//
දානෙ දෙයි ද වෙස්සන්තර//
බෝ දොස් කියා.....

- ශ්‍රී වික්‍රම නූර්තිය - නීතීඥ ජෝන් ද සිල්වා
වාසනා දිනේකි මේක පාමූ - තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමූ තුටින්
පාමූ තුටින් නටමු - මේ ලී දරා අතේ
වාසනා දිනේකි මේක පාමූ තුටින්

කෝමල මධුර බසිනි මේ ගී - සාදා පවසමු දැන්
නටමු පේළි පේළි සැදී රජිඳා තුටු වන මෙන්

සිරියා වසා ය උරේ - ආසාවේ භූපති
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී
ආලෝක වී රජිඳු බෝ ප්‍රීති වී අපේ
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
නට නට කිංකිණී නාද දීමෙනි යමු පාරේ
තුති දිදි බොහෝ සේ භූපති ලක වැජඹේවා
නිතිනා නිරෝගි වේවා රාජා මේ සිංහලේ
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
තේජසා තිබේ ය දීපෙ ආලෝක වී අපේ
ආලෝක වී රජිඳු බෝ ප්‍රීති වී අපේ

නූර්තිය - විධුර

නිෂ්පාදක - නීතීඥ චාල්ස් ඩයස්

දම් වැසි වස්සන ලෝකේ විධුර පඬී
නොදුක වී ය මා ළය සෝකේ විධුර පඬී

රෝග ලීලා දක්වලා ප්‍රයෝගෙන්
ගෙන්වමි ඒ පඬිදුන් මෙහි නා ලෝ
ශ්‍රවණ කරණ සේ මධුර බණ කථා
එතුමාගේ විධුර පඬී

ධර්ම ප්‍රචාරක කමිටුව

නාඩගම් ගීත

නාඩගම :- දික්තල කාලගෝල

රචකයා :- චාර්ල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

චරිත :- කාලගෝල සහ දික්තලා

තාලය :- තංගපාට තාලය

කාලගෝල :- අපි ගමට යමු - ගමට යමු
බිරිඳ බලන්න මගෙ නෑදෑයෝ

දික්තලා :- මට මොටද වදේ - මොටද වදේ
සුරිඳ බලන්න අහෝ මා දෙසේ

කාලගෝල :- ඉලව්වේ මාන්නේ පැහිච්ච ගෑනි//
තෑගි ලැබෙයි තිට තෑගි ලැබෙයි
බිරිඳ බලාලා මගෙ නෑදෑයෝ

දික්තලා :- නටන්න වාගේ මේ කළු මිට්ටා//
වාහෙ අපොයි මගෙ වාහෙ අපොයි
සුරිඳ බලාලා මා රැක දේවා

නාඩගම :- දික්තල කාලගෝල

රචකයා :- චාර්ල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

චරිතය :- කාලගෝල

තාලය :- තංගපාට තාලය

ආලෙ බැන්ද මාගේ රම්‍යවන්....//
මේ සුනිමල මගෙ දික්තල//
ආලෙ බැන්ද මාගේ රම්‍යවන්
අවුරුදු සතක් දුකීන මෙහෙවර කර මෙමාව
ගත් ලඳුන් මගේ ඇගෙ රූපෙබෝ අගේ//
ආලෙ බැන්ද.....
යන්නට ගමට මෙදින - මවුපියන් දකින ලෙසින//
තෑගි ලෙසට දැන් ගෙන යාමි රස කැවුම්//
ආලෙ බැන්ද මාගේ රම්‍යවන්//
මේ සුනිමල.... මගෙ දික්තල....
ආලෙ බැන්ද....

නාඩගම :- දික්තල කාලගෝල

රචකයා :- චාර්ල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

චරිතය රඟදැක්වීම :- දික්තලා

තාලය :- පසන් තාලය

රතදර සිරියා පරදන රූපෙට වටිනා
නිමල කොමල තරුණී
අයියෝ මාගේ යොවන කාලේ
මෙහෙමද පසුවන්නේ
නැත කිසි ආලේ මාගේ අඟුටුමිටියටා
මවුපියො අත බැඳ දුන්....
ඇත්තේ චිත්තේ මාගේ බෝසේ
මේ වූ දුක පමණයි
නැත කිසි ආලේ මාගේ අඟුටුමිටියටා
මවුපියො අත බැඳ දුන්

දික්තලා කාලගෝල නාඩගම

නාඩගම :- බැලසන්ත

රචකයා :- ක්‍රිස්තියන් පෙරේරා

තාලය :- පසන්

පායාලා අම්බරේ චන්ද්‍රයා දිසි
සුන්දර රූපේ මාගේ
රජිදානෝ රම්‍යා වැන්කරේ හි
පෙපැයින් නම් නිරිදාගේ

මනහාර දෝණිය වේ මම්
නෙක රාජ සම්පත් දීමෙන්
තැනූ බාලෙ සිට නිති
ආදරයෙනි බෝ
එංගල් කීනා නාමෙන්

කපිල පතිරත්න
ගිරිඵල්ල

ගැමෆෝන් ගීත

දුර පෙනෙන තැනිතලා

දුර පෙනෙන තැනිතලා-අනුරාධපුර දිහා.
පුන් පෝයා දා-දේ ශ්‍රියා- සාදු කිය කියා.

ඇත කිරි පාට-පේන සරුසාර- සෑය දිළෙනවා
සෑය දිළෙනවා ....
නැහෙන රිදී සිනු හඬින් ගුවන එළි කලා.
ගුවන එළි කලා ....

ජේතවනරාම-අභයගිරි වෙහෙර-සාදු කිය කියා.
කරමු වන්දනා ....
යමුද අනේ-ඉවුර දිගේ-තිසා වැව වටේ.
තිසා වැව වටේ ....

මහා බෝධි මුලේ...

මහා බෝධි මුලේ.....
මහා බෝධි මුලේ
විදුරසුනේ රැස් විහිදෙන්නා
මහා සාද් තුමාණේ
විදුරසුනේ වැඩ ඉන්නා
මහා බෝධි මුලේ..

සාතී සදෙවි නො සුරනා
ගුණ ගීත නාද දී
අහසේ සුරංගනාවෝ
මනරම් රැඟුම් දිදී

පුදනා සඳෙහී දෙව්ලොව
මල් වැස්ස වහින්නා
මහා සාද් තුමාණේ
විදුරසුනේ වැඩ ඉන්නා
මහා බෝධි මුලේ..

වෛශාක්‍ය චන්ද්‍ර කාන්ති සුරන් මළානීක දී
ශ්‍රී ශාන්ති පානා තිලොවේ ඒක ලෝක දී
නව නීල පීථ ආදී බුදු රැස් විහිදෙන්නා
භගවාත් භගවාත් භගවාත්
මහා සත් සව් කෙලෙසුන් පරදන්නා

දැඩි කළ මාතා පෙම්බර මාතා

දැඩි කළ මාතා පෙම්බර මාතා
වඳිමී පා යුග ඔබගේ
දස මස කුසයේ මා රැක සිටියේ
දුක සැම සැප සේ ඉවසා

ඔබෙ හදවත ලේ කිරට පෙරා
පොවලා මා කුසගිනි නිවලා
දරු සෙනෙහස බැඳ බාලෙදි මා
සිඹිමින ආදර පා

මා හඬනා කල ලෙඩ සෑදී
රෑ දාවල් සිට සෝ දුකෙනී
ඇහැ පිය නොපියා රැක මැණි
සනසා නළවා මා

දී අවවාදේ නිසි වයසේ
පානා බුදු ගුණ මැණි මගේ
නිදුකිනි නිරොගි වී වාසේ වේ
සුරිදුනි රැක දේවා

මව් පිය ආදී සොඳුරු තමාගේ

මව් පිය ආදී සොඳුරු තමාගේ
කුල දෙටුවන් සැමා ...//
යෝග්‍ය වූ කාලේ නොමද ප්‍රේමෙනී //
ගෞරවයෙන් පිදුමා යුතු වේ
කුල දෙටුවන් සැමා

ආයුෂ වර්ණා සැප බල ප්‍රඥා
යන මේ අගනා ප්‍රතිඵල නේකා ...//
ගෙනදේ සංකා නෑ මෙලොවේහී
සාදරයෙන් පිදුමා
කුල දෙටුවන් සැමා

ලෝකනාථගේ මංගල සූත්‍රේ
ඒ විශේෂයෙනි පා වදාලේ ...//
වැඩ සෑදේවී ඉන් දෙලොවේහී //
කටයුතු සංග්‍රහයෙන් පුදව්
කුල දෙටුවන් සැමා

කපිල පතිරත්න ගුරුවරයා

කණ්ඩායම් ගී

මුලු ගතම වෙහෙසුනා

මුලු ගතම වෙහෙසුනා -
දහඩියෙන් නැහැවුණා
කුසගින්න නිවා ගන්න මෙමා
යකඩ තලන්නා
වෙහෙසිලා ... දුක් විඳලා
කම්මලේ ... යකඩ තලා

පාන්දරින් නැගිටලා - දෙවියන් වැඳපුදලා
දරුවන් මුව සිඹලා - ගිනි මැලය දල්වලා
යකඩ ගිනියම් කරලා - ගොන්ට ලාඩම් හදලා
ගැලට පණ උපදවලා - දවසෙ වැඩ අරඹාලා

දඬු අඬුව තද කලා - යකඩෙ ඊට හයි කලා
දැත වාරුව යොදලා - පීර කිරි කිරි ගාලා
පිහිය හැඩ වැඩ දාලා - මුවත පන්නර තියලා
හැදුවෙ කම්මලෙ කියලා - මාගෙ වරුනේ
පෙන්නලා

කඩ ඇනය ඇද වෙලා - යකඩ පට්ටම ගෙවිලා
බරබාගෙ පෙරලිලා - මා ළඟට පැමිණිලා
මම වරුණේ පෙන්නලා -
කඩිමුඩියේ වැඩ කලා
බරබාගෙ නැගිටලා - යලි යෑම අරඹලා

කඳ සුරිදුනි ඔබෙ

කඳ සුරිදුනි ඔබෙ ඔද තෙද දැක හද
පිබිදුනු සිතැතිව පුද දෙමු බැතියෙන
ඔබ යැදුමට ආවා.. අපි
ඔබ පිදුමට ආවා...

සත්ගිරි වටකොට - ඔබෙ නිවහන ඇත
සත් සිදු පතලව ඔබෙ කිතුගොස ඇත
ඔබ යැදුමට ආවා.. අපි
ඔබ පිදුමට ආවා...

මයුරාසන මත
වැජබෙන තෙදැතිව
උතුරන හදකින් පුද දෙමු බැතියෙන
ඔබ යැදුමට ආවා.. අපි
ඔබ පිදුමට ආවා...

කඳ සුරිදුනි ඔබෙ
පිහිට ලැබේවා
මගෙ රට සව්සිරියෙන් සපිරේවා
ඔබ යැදුමට ආවා.. අපි
ඔබ පිදුමට ආවා...

මංගෝ කළු නැන්දේ

මංගෝ කළු නැන්දේ මොකදෑ මේ පැත්තේ
හැන්දෑ යාමෙ බලා ගෙදරින් පැනගත්තේ

බුලත් කොරටුවේ ලපටි දළු පැහේ
මංගොට දැන් හරිම වැඩ වගේ
පොලට ගෙනල්ලා ලාබෙට විකුණාලා
ගෙදර එන්නෙ හිනා වැහි වැහී

මංගො නැන්දගේ දුව අන්ගො කුමාරි
ගිය සුමනෙ පැනල ගිහිල්ලා
ඇය අඬා වැලපිලා
පොලවේ හැපී නැගිටලා
වැඩක් නැහැනෙ දැන් පසුතැවිලා

අහල පහල හැමෝම
ඇගෙ කටට බය වෙලා
ඉන්නෙ ඇයට දිනුම පවරලා
මාම ගෙදර ආව දාට ඇව හිරවෙලා
දහයට ගැනගන්න බැහැ වගේ

මුව හසරැලි සාගරේ

මුව හසරැලි සාගරේ මුතු වැලක් වෙලා
නෙත් අඹරේ පායලා තරු දෙකක් වෙලා
දේදුන්නක සඟවලා දෙතොල් රත සලා
ඔබ මගෙ මුලු ජීවිතේ රහඟලක් කලා

සඳ විමනේ විසිතුරු පවසා
නෙත් එළියෙන් තොරතුරු විමසා
දිය වදනය සලුවක දවටා
සැනසිල්ලේ උණුසුම ගවසා.. ආ...
ඔබ නලවන්නම් . ඔබ සනසන්නම්
ඔබ නලවන්නම් . මම ඔබ සනසන්නම්
නොමියන සුළු ආදරයක කථා කියන්නම්

සඳ විමනේ සොම් ගුණ මවලා
දේදුන්නක සිසිලස ඔතලා
මල් කෙමියක මදු රස සොයලා
සල් අරණක පවනැලි නිවලා.. ආ...
ඔබ නලවන්නම් . ඔබ සනසන්නම්
ඔබ නලවන්නම් . මම ඔබ සනසන්නම්
නොමියන සුළු ආදරයක කථා කියන්නම්

කපිල පතිරත්න ගුරු උපදේශකයා

ප්‍රශ්න අංක 05

1. නිර්දේශිත ගැමි ගීයක් ගායනය කිරීම. (ආඝාතාත්මක හෝ අනාඝාතාත්මක)

නෙළුම් ගීත

ඉපල් පිටින් ගහන අච්ච පිටට ඉහිරවන්නේ
තෙතඟු තෙතරි යේ රිඟුතරි ඒක එහෙම වන්නේ
රණ කැකිරක් කාපු ලෙසට කටට මිහිර වන්නේ
තෙතඟු තෙතරි යේ රිඟුතරි ඒක එහෙම වන්නේ

නිල් හබරල ගොයම් ලෙසට ගොයම් නිල්ල වන්නේ
තෙතඟු තෙතරි යේ රිඟුතරි ඒක එහෙම වන්නේ
මේ කුඹුරේ නෙළු කලට ගොයම් රෝග යන්නේ
තෙතඟු තෙතරි යේ රිඟුතරි ඒක එහෙම වන්නේ

බාල ළමාවරු නෙලුමට කැන්දන ඔමරි කතාවෙන් පසුවන්නේ
නෙලන්න සැරසී එන අඟනන්ගේ ඉස පීරා මල් ගවසන්නේ
නෙලන්න බැරි අය කුමට ද එන්නේ දැහ රිදෙන සේ පසුවන්නේ
ලප්ජාවට කවි සින්දු කියාගෙන නෙලුම එතෙක් කරලයි එන්නේ

මහ තනිතින

ග´	ම	ප	ප	ප´	-	ධ	ප	ම´	ප්‍රම	ධ	ප	ම´	ම	ම	ම
බා	ස	ල	ළ	මා	ස	ව	රු	නෙ	ළුම	ට		කැ	න්	ද	න
ග	ම	ප	ප	ප	-	ධ	ප	ම	ප්‍රම	ධ	ප	ම	-	-	-
ඔ	ම	රි	ක	ථා	ස	වෙ	න්	ප	සුව	න්		නේ	ස	ස	ස

මැදුම් තනිතින

ස´	රි	ම	ග´	ග	රි	ස´	රි	ග				රි´	ස	ස	
ස	රි	ම	ග	ග්‍රරි	රි	ස	රි	ග				රි	ස	-	

කමන් ගී

ඉරු දෙවියෝ වැඩිය තැනේ - බොල් පිනි නොතිබෙයි එතැනේ
සඳ දෙවියෝ වැඩිය තැනේ - කරුවල නොතිබෙයි එතැනේ
මහ ගජතුන් බැන්ද තැනේ - කණු මුල් නොතිබෙයි එතැනේ
සැම දෙවියෝ වැඩිය තැනේ - උවදුරු නොතිබෙයි එතැනේ

තුන් සරණේ ගීත

බුද්ධං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදා ගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉක්මැදුයි තුන් සරණේ අදහාගෙන

සීත ගඟුලෙ දී ඇඳ පේවෙනවා
එතන දි සමහරු පඬුරු බඳිනවා
කෝඩු කාරයෝ ඉස්සර වෙනවා
සමන් දෙවිඳුනේ අප රැක දෙනවා

ගොයම් ගීත

රන් දැකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉණ වට දිලිසෙනවා
රිවි දුටු පිනි බිඳු ලෙස පහවෙනවා
දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

පහත දැක්වෙන්නේ හෙළ ගී මගෙ හි දැක්වෙන ප්‍රස්තාරයයි.

+	ග-	ග	රිස	ස	සරි	ග	රිස	නි	නිස	රි	ස	නි	නි	ස	-
+	රන්	දැ	ss	කැ	තිs	ගෙ	නs	s	නිති	සැ	ර	සෙ	න	වා	s

ගොයම් ගීත

රිදියෙන් තනලා රත්රන් ඔපලා කැරලි කෙටුවයි දැකැත්තේ
සුරතට රන්වන් විලි පාහාලා කදිමට දිලිසෙයි දැකැත්තේ
අඩියෙන් අඩියට තාල තියන්නට සබයෙන් අවසර ලැබ ගත්තේ
සතර වරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි දැකැත්තේ

මහ තනි තින

|+ ග්‍රම ප ප | ප - ධ ප | ම ප්‍රම ධ ප | ම ම ම ම|
|+ ග්‍රම ප ප | ප - ධ ප | ම ප්‍රම ධ ප | ම - - -|

මෙම නාද මාලාව අනුව ඉතිරි පද ගායනා කෙරේ.

ගොයම් ගීත

උදයට පායන හිරු දෙවියන්ටයි
සවසට පායන සඳ දෙවියන්ටයි
සතර වරම් දෙවි සතර දෙනාටයි
වැඳලා ගුරුවර අවසර ගන්ටයි

කපිල පතිරත්න ගුරුවරයා

ඔළිඳ කෙළිය

දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්න යන සැටි බලන් කළු
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි කළු
දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා බලයි කළු
දුනුකේ මලසේ උළුගෙයි ඇඳපිට ඔළිඳ කෙලින සැටි බලන් කළු

මේවර කෙළිය

සාර සදිසි පෙති පේර නෙලන කල
වළ ගියදෝ මගෙ මේවරයා
නෑනෝ නුඹපල් නුඹෙ දරුවන්පල්
අප දුටුවේ නැත මේවරයා

ඔංචිලි වාරම්

අර බලන්න ඉර ගිරවිගෙ පැටියෝ
අර බලන්න සඳ සාවිගෙ පැටියෝ
අර බලන්න සඳ රණාමොණරිගෙ පැටියෝ
අර බලන්න කවි අසනා දෙවියෝ

උඩරට ශාන්තිකර්ම ගී

නිරිත කොන යුතා - මල් මල් සුවඳැති
වැටකෙ වන වෙතා
උරග පෙණ ලතා දුන්වන් පාටින්
මැණික හිමි වෙතා
තල ද කිරිබතා ලොල් ලොල් වඩවන
සිතට රුචි ඇතා
පණිඳු දෙති සෙතා සුන් සුන් කර දොස
ඔබට සෙත දෙතා

කපිල පතිරත්න
ගිරිඋල්ල කලාපය

ගැල් ගී

දුප්පත් කමට ගොන් බැඳ ගෙන දක්කනවා
කන්ටත් නැතුව දිව රෑ අපි වෙහෙසෙනවා
ගොන්ටත් නොයෙක් වද දී අපි ගෙනියනවා
දැන්වත් දුකට දෙවියෝ පිහිටක් වෙනවා

කළු ගල් තලාලයි පාරට දමන්නේ
එම ගල් පෑගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර දින්නේ
කිරිගල් පොත්ත කන්දයි අපි නගින්නේ

පාරු ගී

මලේ මලේ ඔය නාමල නෙළා වරෙන්
අත්ත බිදෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැලණි ගෙඟ් ඔරු යනවා බලා වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී වරෙන්

මාතර ගඟේ ඉන්නා කිඹුලිගේ පැටියා
තල්ල සුදුයි බෙල්ලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතා ගෙන සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගේ පැටියා

පැල් ගී

වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනි
ඉන් එක ගොනෙක් වලිගය නැතිව වැනි වැනි
වලිගය ඇති ගොනා මැස්සන්ට බැට දුනි
දුප්පත්කමත් වලිගය නැති ගොනා වැනි

ගැල් ගී

තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා
කටුකැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව්කල ගොනෝ ඇදපන් හපුතල් යනවා

පතල් ගී

කළු වන් කළු රුවයි මන්ගෝ දිලිසෙන වා
මිනිරන් තෝරන්න දින ගණනින් යන වා
මිනිරන් තේරුවොත් ලඳ නුඹ කළු වෙන වා
ලගනම් ගෙදර මුර ඇරුනම මම එන වා

දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ
රට වෙඩි දමා කඩනා කළු ගල් කැටියේ
මඩ යට තිබෙනා මිනිරන් ගන්නා සැටියේ
උඩ වැඩ කරනා අයට දෙන්නේ අඩු පඩියේ

බඹර ගී

බැද්ද වටට සුදු මොරමල් පිපිලා
සද්ද කර බඹරු ඒ වග අසාලා
ඉටිත් පැණිත් ලොව සැමටම බෙදාලා
යන්නම් බඹරු දුක් මැසිවි කියාලා

අම්මා පල්ල බඹරුන් අත වරද නැතී
කැලේ තිබෙන මල් කාලා උන් රැකෙතී
අනුන් කරන ගොවිපකට හානි නැතී

බඹර කපන අය නරකාදියේ යතී

කපිල පතිරත්න ගුරු උපදේශක

5 . 2 වන්නම් හෝ ප්‍රශස්ති හෝ හටන් ගී යන සේ ගී අතුරින් කැමති එක් වර්ගයකට අයත් ගීතයක් **ගායනය කිරීම.**

වන්නම්

උඩරට වන්නම් - උකුසා වන්නම

තානා තනෙන තනම් //
තානත් තනෙනත් තම්දෙන තානා //
තානා තනෙන තනම් //

මෝරා බීජයෙනා //
කලපත් දෙකඩත් කර සිත් තුටු වෙත් //
දෙන්නා අදර තොසා

නෑරා තටුපතිනා //
ලෙලවත් සොලවත් පියඹත් නද දෙත් //
යන්නා පවන රැසා

සාරා බොජුනයෙනා //
අයිරත් පෙතියත් තුඩ ගත් බුදි සිත් //
පැන්නා එජල රැසා

බේරා ඉසිහු දූනා //
පවසත් මෙපවත් දූන සත් ලොවටත් //
වන්නා නම් උකුසා

පහතරට වන්නම්- සින්දු වන්නම

තානම -

තෙන තෙන තෙන තෙනෙනා
තෙනම් තෙන.....තෙනෙනා

සේවිත පාද සරෝරුහ සන්ජිත යෙන් ඉතා
පූජිත තෝස දිගාසිරි දී මෙන් සන්තතා
වාරික නාථ ග්‍රහාතෙයි සිරුසත විතතතා
පූජිත විෂ්ණු සුරාදිප රූප අලංකෘතා

කපිල පතිරත්න
ගිරිමල්ල කලාපය

සබරගමු වන්නම් - කෝකිල වන්නම

තානම :-

තාන තනා තන තනෙනා - තෙතන තනා තන තනෙනා

තාන තනා තම්දෙනා - තානෙන තම් තෙතන තනා තම්දෙනා

කවිය

කොහොව් යනා හඬ නඟනා - මියුරු මනා දන සවනා
පරපුටු වෙසෙසින්නේ වසන්නේ - මහවන ගස් මුදුනේ

රිටු විමනා බිජු ලමිනා - බහු නදනා රැකෙන මෙනා
ලොකු වී නද දෙන්නේ - ඔවුන්ගේ එම විට බැට කන්නේ

රුව සමනා උවත් මනා - ඉසි වඩනා රිටු නොමිනා
රිටු පරපුටු හටනේ - දෙවන්නේ නිදසුන් යස රුවනේ

ලොව දුර්ජනා ගතිය මනා - මෙම හට නාලොව තිබෙනා
අසනුය වියතුන්ගේ ගයන්නේ මේ මනහර වරුණේ

ප්‍රශස්ති

ලක්ෂ්මී බුජවාසා
සතතු ජය

වීර විජය ලක්ෂ්මී ශිවකාමී
නෑර බාහු ශිබරය විසු ප්‍රේමී
සාර වතිත ගරු වචනැති සෝමී
වීර නරේන්ද්‍ර සිංහ ස්වාමී

සත්‍ය වචන හරිශ්චන්ද්‍ර ව තාරා
නිත්‍ය ලෝක සංගීත සුහෝජා
මත්ත ධීර හරි හත වර තේජා
පෘථිවි පාල කුල බන්ධු සරෝජා

ශෘංගාධර ශූර නිවසේ මුහුදා
තුංගා කර දස දිග සුවිබෝධා
ශෘංගාතේ නව නාට්‍ය විනෝදා
ලංකාපති වර රාජ වරෝජා

වරමාති සුභ චරිතේ
ලංකා පති නරේන්ද්‍ර සිංහ නෘපතේ

හෝජරාජ සම තේජ හි රාමා
ත්‍යාජ කාම රණ භූෂණ සෝමා
වාජිත කුල ධෘති වන්තහි රාමා
නරේන්ද්‍ර සිහ නර නායක භූමා

දුජ්ජන දුෂ්ට විභජ්ජන කෝපා
සජ්ජන සත්ත සුරක්ෂ මනාපා
වජ්ජිත රිෂ්ටා වද්‍ය සුපාපා
අජ්ජුන භූ භුජ ශ්‍රීධර චාපා

හටන් ගී

නොමදින් විකුම් පාලා
සැදෙමින් යුදට ජය ලන්දෙසින් සමගින් එ ජනරාලා
සමිඳුන්ගෙ භූමිපාලා
සියසේ අතින් මියෙමින් ගියෝ යුදයෙන් ඇනුම් කාලා

රන්නා එ ලන්දේසී
පන්නා මෙලෙස පෙන්නා බලය පන්නාලිය සී සී
ගෙන්නාල ඉංග්‍රීසී
දන්නා ඔවුන් ගෙන්නා බැඳල සෙන්නා අයට දාසී

දුරලා සතුරු වියවුල්
කරලා දිගඹු බබලා වැජඹී නිමලා එකින් එක දුල්
ළකලා මෙ අප මිහිපල්
සකලා සිරින් විකලා නොකර මැඩලා නැසී වියවුල්

නොමදින් විකුම් පාලා
සැදෙමින් යුදට ජය ලන්දෙසින් සමගින් එ ජනරාලා
සමිඳුන්ගෙ භූමිපාලා
සියසේ අතින් මියෙමින් ගියෝ යුදයෙන් ඇනුම් කාලා

යුද්දෙටත් ඇවින් සිඳුපිට නැව් නැගලා - පරංගි
උන් නමුත් ඇවින් කොළඹට ගොඩබැහැලා
අන්දමත් හොඳයි කිසි බීසි ගාලා - කොළඹදි
කම්පලත් නැතත් සෙනගක් මරා දාලා

කපිල පතිරත්න ගීවදන කලාපය

ප්‍රශ්න අංක 06

1. මෙම ප්‍රශ්නය සඳහා වාදන අංග දෙකක් ඉදිරිපත් කළ යුතුය.

කැමති සංගීත භාණ්ඩයකින් (ස්වර පුවරු භාණ්ඩ හැර) කැමති ගීතයක් **(ඉහත ප්‍රශ්න සඳහා ඉදිරිපත් කළ ගීත හැර)** වාදනය කිරීම.

එසේ නොමැති නම්


කැමති සංගීත භාණ්ඩය ලෙස තබිලාව යොදා ගන්නේනම්, නිර්දේශිත තාලයක ධේකාව සමග කායදාවක් සහ පල්ටාවක් වාදනය කිරීම.

"සුවඳ පද්ම ඔලු ආදි " නූර්ති ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය

	X	0	X	0
ස්ථායී	ධ̣ ප̣ ධ̣	ස-රි	ග-ධ	ප-ප
	සු ව ඳ	පත්ම	ඕඝළු	ආඝදි
	ග ග රි	ස-රි	සරිගරි	ස--
	නොයෙක	පුෂ්ප	යෙඝන්සැ	දීss
	ප ධ නි	ඝ්-ධ	ම-ධ	ප-ප
	ස ර ණ	හංස	සේඝරු	බෝඝම
	ග ග රි	ස-රි	සරිගරි	ස--
	පොකුණු	සීත	පැඝන්පි	රීss

	X	0	X	0
අන්තරා	ගගග	ප-ධ	ඝ්-ධ	ස--
	වකුර	නාඝන	නෙක්ද	නෝss
	නිනිධ	ප-ධ	පධනිධ	ප--
	පැමිණ	නාඝකි	ශ්‍රීෂ්ම	යන්ට
	පධනි	ඝ්-ධ	ම-ධ	ප-ප
	මමද	නාඝග	ලෝඝක	යෙන්ම
	ගගරි	ස-රි	සරි ග රි	ස--
	මෙපුර	ආඝමි	නාඝ ඝ න	සේss

කපිල පතිරත්න ගිටාර්ම්ල කළාපය



කපිල පතිරත්න ගිරිටලේ විලාපය

හා හා හරි හාවා

Intro + Inter	ධ – ප –	ම – ග –	රි – ස –	නි̇ – ධ̣ –
	ප̣ – ස –	නි̇ – රි –	ස – – –	– – – –
Song	ප – ග –	ම ම ධ –	ප – – –	– – – –
	රි රි – ග	ම රි නි̇ ධ	ප – – –	– – – –
	ධ ධ ප ප	ම ම ග –	රි – ස –	නි̇ – ධ̣ –
	ප̣ ප̣ ස ස	නි̇ නි̇ රි රි	ස – – –	– – – –
Verse	ග ග ග ග	ග ග ම –	ග – – –	– – – –
	රි – රි රි	රි රි ස රි	ග – – –	– – – –
	ප ප ස̣ ස̣	නි නි ධ ධ	ප – ම –	ග – රි –
	නි̇ – රි –	ග – රි –	ස – – –	– – – –

ත්‍රී තාල් කායදා

කායදා - 01

ධා ධා නි ට / ධා ධා තූ නා / තා තා නි ට / ධා ධා තූ නා

පල්ටා

1. ධා ධා නි ට / ධා ධා නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා
   තා තා නි ට / තා තා නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා

2. ධා නි ට ධා / නි ට නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා
   තා නි ට තා / නි ට නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා

3. නි ට නි ට / ධා ධා නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා
   නි ට නි ට / තා තා නි ට / ධා ධා නි ට / ධා ධා තූ නා

කපිල පතිරත්න
ගුරුවරු කලාපය

කායදා - 02

ධා ධා තිරි කිට / ධා ධා තූ නා / තා තා තිරි කිට / ධා ධා තූ නා

පල්ටා

1. ධා ධා තිරි කිට / ධා ධා තිරි කිට / ධා ධා තිරි කිට / ධා ධා තූ නා
   තා තා තිරි කිට / තා තා තිරි කිට / ධා ධා තිරි කිට / ධා ධා තූ නා

2. තිරි කිට ධා ධා / ධා ධා තිරි කිට / ධා ධා තිරි කිට / ධා ධා තූ නා
   තිරි කිට තා තා / තා තා තිරි කිට / ධා ධා තිරි කිට / ධා ධා තූ නා